17

# මහාචාර්ය සේනක බිබිලේ



මහාචාර්ය සේනක බිබිලේ විවිධ දුෂ්කරතා මධ්‍යයේ අධ්‍යාපනය ලැබ, එයින් විපුල ඵල නෙළා ගත් විද්වතෙකි. එතුමා වෛද්‍යවරයකු, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරයකු, පීඨාධිපතිවරයකු සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සමාරම්භක සභාපතිවරයා ද ලෙස අප්‍රතිහත ධෛර්යයෙන් කටයුතු කළ ආකාරය අපේ දූ දරුවන්ට මහඟු ආදර්ශයකි. ජනතාවාදී වෛද්‍ය සේවාවක් හා ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමෙන් සෞඛ්‍ය සම්පන්න සමාජයක් ගොඩ නැඟීමට කටයුතු කළ එතුමා ජාත්‍යන්තර පිළිගැනීමට ලක් වූ මානව හිතවාදියෙකි. සරල දිවි පෙවෙතක් ගත කළ එතුමාගෙන් අපට ගත හැකි ආදර්ශ බොහෝ ය. මෙහි දැක්වෙනුයේ 'පූජිත ජීවිත' පස් වන වෙළුමට දෙනගම සිරිවර්ධන විසින් සම්පාදිත ලිපිය ඇසුරෙන් සකස් කළ පාඩමකි.

"මිනිස් වර්ගයා කෙරේ ඔහු අසීමිත ආදරයක් දැක්වූයේ ය. මිනිසාගේ බිඳ වැටුණු වීර්යය නඟා සිටුවීමට කටයුතු කළේ ය. වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම සත්‍යවාදියකු, මානව හිතවාදියකු වූ ඔහු වැන්නකු යළි අපි කවදා දකිමු ද?"

1978 ඔක්තෝබර් 08 වැනිදා කොළඹ ජාවත්ත සුසාන භූමියේ දී මහාචාර්ය කාලෝ ෆොන්සේකාගේ මුවින් මේ වදන් ගිලිහුණේ විදේශයක දී මරණයට පත් වූ සැබෑ මානව ප්‍රේමියකු වූ මහාචාර්ය සේනක බිබිලේගේ භස්මාවශේෂ තැන්පත් කළ අවස්ථාවේ දී ය.

"විවිධ බලවේග නිසා සාමාන්‍ය මිනිසා මිරිකෙනවා. ඔවුන් ඒවායින් මුදා නොගෙන, ඖෂධවලින් පමණක් සුවපත් කිරීමට සිතීම මහා මුළාවක්. ඉතින් සහෝදරය, අපට ජනතාව වෙනුවෙන් ඒ බලවේග සමග ගැටෙන්නට සිදු වෙනවා" දෙසීමෙන් පමණක් නො සෑහී ඒ වදන්හි අරුත් සැබෑ ජීවිතයේ දී ක්‍රියාත්මක කිරීමට අවංක වෑයමක යෙදුණු සේනක විලියම් බිබිලේ, උපත ලැබුවේ 1920 පෙබරවාරි 13 දින අහංගම කතළුවේ සිය මවගේ ගමේ දී ය. ඔහුගේ මව සිල්වියා ජයවර්ධනයි. පියා බිබිල වලව්වේ චාල්ස් විලියම් බිබිලේ ය.

"රදලකමෙන් මට වැඩක් නැහැ. ගොවීන් විතර මට ඔය රදලයන් වටින්නෙ නැහැ. මගේ සේනක පුතාට කිරි දෙන්න එයාගේ අම්මගේ තනේ කිරි නැති වුණා ම ගමේ ම දුප්පත් ගෑනු ඇවිත් කිරි දුන්නා. ඔය දුප්පත් ගොවීන්ගෙ ගැහැනු සියයකගෙන් විතර මගේ පුතා කිරි බොන්න ඇති. මගේ ගෑනිගේ කිරිවල යි ඒ ගැහැනුන්ගේ කිරිවල යි කිසි වෙනසක්

නැහැ. පුතා අගේට හැදුණා" යැයි සිය පියා කියූ කතාව සේනක බිබිලේගේ ජීවිතය පිළිබඳ දැක්ම හැඩ ගැස්වීමෙහි හේතු විය.

"මුළු දහවල පොළොව මත්තේ හැපෙමින් අනන්ත දුක් පීඩාවලට ගොදුරු වෙමින් සපයා ගත් ලෙයින් පෙරා ගත් කිරි ගමේ ගොවි කාන්තාවන් මට පෙව්වා. මගේ සිරුර ඔවුන්ට අයිති යි. මුළු ජීවිතය ම ඔවුන්ට ණයගැති යි" යනුවෙන් තරුණ සේනක බිබිලේ මේ පුවත ආවරණය කෙළේ ය.

සේනක බිබිලේ ඉගෙනුම ලැබූයේ මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ ය. එහි දී ඔහු පන්ති කාමරයේ දී මෙන් ම ක්‍රීඩා පිටියේ දීත් මෙන් ම නාට්‍ය හා සංගීත සන්දර්ශනවල දීත් ද ඉහළ ම දස්කම් පෑවේ ය.

සේනක ඉගෙනුම ලබමින් සිටින කාලයේ දී ඔහුගේ පියා මිය ගියේ ය. පියාගේ අභාවය බිබිලේ වලව්වට පාත් වුණු හෙණයක් බඳු විය.

සිය ඉගෙනුම හමාර කොට නංගීට සහ මල්ලීට ඉගැන්වීමට සේනක තීරණය කළේ ය.

"අපගේ ඉගෙනීම සඳහා වියදම් දැරීමට අම්මාට තනි ව ම අපහසු ය. තාත්තා අප ජීවත් කළේ කොහොම ද කියලා හිතන්නත් බැහැ. ඔහු මිනිස්සු තළා පෙළා මුදල් රැස් කළ අයෙක් නොවෙයි. ඔහු ගොවීන්ට සිය ඉඩම් දී සුළු ආදායමක් ලැබුවා. දැන් අම්මාට ඒවා කරන්න බැහැ. මා ලැබූ අධ්‍යාපනයේ තරමට මට දැන් කෘෂිකර්ම නිලධාරියෙක් වෙන්න පුළුවනි. ලැබෙන පඩියෙන් නංගීට සහ මල්ලීට උගන්වන්න පුළුවනි" ඔහු සිය පන්ති භාර ගුරුතුමාට කීවේ ය.

ගුරුතුමා රහසිගත ව එය විදුහල්පතිතුමාට කීවේ ය. මේ පුවත පැතිරිණ. සේනකගේ ඉගෙනීමේ කටයුතු සඳහා සියලු වියදම් දැරීමට මහනුවර වැසියෙක් ඉදිරිපත් විය. ඔහු කවුරුදැ යි දැන ගැනීමට සේනකට ලැබුණේ බොහෝ කලකට පසු ව ය.

ඉහළ ම ලකුණු ලැබූ සේනක සිසුවා වෛද්‍ය විද්‍යාලයට ඇතුළු විය. වෛද්‍ය විද්‍යාලයට යාම සඳහා ඔහු නවාතැන් ගත්තේ බොරැල්ලේ හෝටලයක කුඩා කාමරයක ය. ජීවිතය ඉතා කටුක විය.

වෛද්‍ය විද්‍යාලයේ දී ඔහු ශිෂ්‍යත්ව කීපයක් දිනා ගත්තේ ය. ඒ නිසා ඔහුට මුදල් යැවීමට අම්මා වෙහෙස විය යුතු වූයේ නැත. අඩුවෙන් ආහාර ගෙන, අවශ්‍ය වියදම් පමණක් දරා ඉතිරි කර ගත් මුදලෙන් ඔහු ගත්තේ පොත් ය. වෛද්‍ය විද්‍යාවට අදාළ පොත් මෙන් ම අනෙක් විෂයයන් ගැන ලියැවුණ පොත් ද ඔහුගේ රාක්කයේ තිබිණි.

වෛද්‍ය විද්‍යාලයේ නිවාඩු කාලවල දී ඔහු ගමට ගියේ බෙත් පෙට්ටියක් ද රැගෙන ය.

"පුංචි මහත්තයා ගමට එන්නේ කවදා දැ?"යි ගැමියෝ සේනකගේ මවගෙන් අසා දන ගනිති. ඔහු පැමිණි දාට පසුදා බිබිලේ වලව්වේ මිනිස්සු පිරෙති. ගසක් යට බංකුවක් තබා ගන්නා සේනක ඔහු ඉදිරියට එන පිරිමි ද ගැහැනු ද ළමයින් ද පරීක්ෂා කිරීමට පටන් ගනී.

"ඇස්වහක් කටවහක් වදින්න එපා. දොස්තර මහත්තය දෙන බෙත්වලින් ලෙඩේ නිට්ටාවට ම සනීප වෙනවා."

ප්‍රතිකාර ලැබ සුව වූ ගැහැනියක් සේනකගේ මවට කියයි. සේනකට ගමේ දී නිවාඩුවක් ලැබුණේ නැත. ගමේ ලෙඩ රෝගවලට මූලික හේතුව අන් කිසිවක් නො ව, මන්දපෝෂණය

බව ඔහු දුටුවේ ය. නූගත්කම තවත් හේතුවකි. මුළු ජීවිත කාලය ම වැඩට යොදවන මේ ගැමි ජනතාවට වැඩෙහි ප්‍රතිඵල වශයෙන් ලැබෙන්නේ ලෙඩ රෝග සහ අසරණ මහලු වයස පමණි.

වෛද්‍ය විද්‍යාලයේ අවසාන පරීක්ෂණයේ ප්‍රතිඵල ලැබෙන තුරු සේනක බිබිලේ පස්සර, මඩොල්සිම සහ ලුණුගල රෝහල්වල සේවය කෙළේ ය.

ප්‍රතිඵල ලැබිණ. ඔහුට පළමු පෙළ සාමර්ථ්‍යයක් හිමි විය. වෛද්‍ය අංශයට පිදෙන රන් පදක්කම සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාවට පිදෙන රන් පදක්කම ද දිනුයේ ඔහු ය.

කොළඹ මහ රෝහලේ නේවාසික වෛද්‍යවරයකු ලෙස සේවය කළ සේනකට පසු ව බිංගිරියේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධිකාරි තනතුර ලැබිණි. ඒ තනතුරේ සේවය කරන අතර ඔහුට හෙට්ටිපොළ සහ බිංගිරිය ග්‍රාමීය රෝහල්වල සේවය කිරීමට ද සිදු විය. රජයෙන් වැටුපක් ලැබීම ඔහුට සතුටක් වූයේ මවට එයින් ලැබුණු සහනය නිසා ය. ඔහු අම්මාට ලියූ ලිපියක මෙසේ සඳහන් කළේ යː

"මල්ලිලා සහ නංගිලා ගැන සිතමින් සිතට කරදර ඇති කර ගන්න ඕනැ නැහැ, අම්මේ, දැන් අම්මාට සතුටින් කාලය ගෙවන්න පුළුවනි. මට දැන් මාසික ආදායමක් ලැබෙනවා. මල්ලිලා සහ නංගිලාගේ සියලු වගකීම් මා බාර ගන්නවා."

බිංගිරියෙන් ඔහුට යළි වෛද්‍ය විද්‍යාලයට යන්නට සිදු විය. එහි කථිකාචාර්ය තනතුරක් ලැබුණු හෙයිනි. විදේශිකයකු වූ මහාචාර්ය හැරී කලම්බයින් ඔහුට එහි දී ඇසුරු කිරීමට ලැබිණි. සේනකගේ මතවාද සමඟ මහාචාර්යවරයා නිතර එකඟ විය.

'ලාංකිකයන්ගේ ශාරීරික සෞඛ්‍යය සහ ඔවුන්ගේ ආහාර පුරුදු' පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණයක් කිරීමට මහාචාර්ය කලම්බයින්ගේ ඉල්ලීම පරිදි සේනකට සිදු විය.

සේනක දිවයින පුරා සංචාරය කරමින් සමීක්ෂණයෙහි යෙදී වාර්තාවක් ඉදිරිපත් කෙළේ ය.

ඒ වර්ෂයේ ම සේනක උසස් අධ්‍යාපනය සඳහා එංගලන්තයේ එඩින්බරෝ විශ්වවිද්‍යාලයට ඇතුළු විය.

එහි දී ඔහු මහාචාර්ය වාන්හෙඩ් මහත්මිය සමඟ එක් ව කළ පර්යේෂණයක් නිසා වෛද්‍ය ක්ෂේත්‍රයේ කීර්තිමත් පුද්ගලයකු බවට පත් විය. ස්ටෙරොයිඩ් ගණයට අයත් විශේෂ හෝමෝන කාණ්ඩයක් පිළිබඳව කළ ඒ පර්යේෂණය අගය කරමින් බ්‍රිතාන්‍ය විද්‍යා සඟරා සහ පුවත් පත්වල ලිපි පළ විය. වෛද්‍ය සේනක බිබිලේ ඒ පර්යේෂණයෙහි නිරත වූයේ ආචාර්ය උපාධිය සඳහා අධ්‍යයනයක් වශයෙනි. ඔහුගේ පර්යේෂණ නිබන්ධය සඳහා එඩින්බරෝ විශ්වවිද්‍යාලය විසින් ආචාර්ය හෙවත් පීඑච්.ඩී. උපාධිය පිරිනමන ලදි.

යළි කොළඹ වෛද්‍ය විද්‍යාලයට පැමිණි ඔහු ශිෂ්‍යයන් පෙලඹවූයේ නිර්මාණාත්මක අධ්‍යාපනයක් සඳහා ය. "ගිරවුන් නොවෙමු, ස්වාධීන ව සිතමු!"

අලුත් අලුත් දැ නො තනන ජාතිය ලොව නො නගින බව කුමාරතුංග මුනිදාසයන් කීවේ පැදි බසිනි. සේනක එය ම ගැදි බසින් කීවේ ය.

"අපේ මුතුන් මිත්තන් සෙවූ දෙයින් අපි අද ප්‍රයෝජන ලබමු. අපගෙන් පසු බිහි වන පරපුරට ද අප යමක් දිය යුතු ය. අලුත් දැ නිර්මාණයට අප පෙලඹිය යුතු ය."

"මෙය වෛද්‍ය විද්‍යාවට ද පොදු විය යුතු ය. අප බටහිර විද්‍යාවට වහල් වීම වැරදි ය. එය



නොම්ලේ බෙදා හැරීම සඳහා ය.

අපේ ම විද්‍යාවක් කර ගැනීමට අපි වෙහෙසෙමු. ජාතික මට්ටමෙන් එය හැඩගසා ගත හැකි ය. පර්යේෂණාත්මක ව එය හදාරමු. ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම ගැන ද මා අධ්‍යයන කරනවා" ඔහු තව දුරටත් කී ය.

1954 දී වෛද්‍ය විද්‍යාලයේ ඖෂධවේදය පිළිබඳ අධ්‍යයන අංශයක් බිහි විය. එහි ප්‍රධානියා වූයේ සේනක ය.

ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සේනක බිබිලේ මහා පුරුෂයකු වූයේ ඔහුගේ නායකත්වයෙන් බිහි වූ ජනතාවාදී ඖෂධ ප්‍රතිපත්තිය නිසා ය.

ඖෂධ නිෂ්පාදනය ලොව ඇති දෙවැනි කර්මාන්තය යි. ප්‍රධාන කර්මාන්තය ප්‍රධාන නිර්යාතය ආයුධ නිෂ්පාදනය යි. අමෙරිකාව, බටහිර ජර්මනිය, බ්‍රිතාන්‍යය, ස්විට්සර්ලන්තය, ජපානය සහ ඉතාලිය යන බලවත් රටවල ප්‍රබල සමාගම් සතු ව ඖෂධ ව්‍යාපාරය රඳා පැවතිණි. ඖෂධ නිෂ්පාදනයට වඩා ඒ පිළිබඳ ප්‍රචාරයට ඒ සමාගම් වියදම් දැරී ය. මේ සමාගම් එක ම ඖෂධය විවිධ නම්වලින් නිපදවා වෙළෙඳ පොළට එවී ය. ඩයසිපෑම් නමැති ඖෂධ නාමය දැරූ බෙත් පෙත්ත සත දෙකක් මිල වූ අතර, එය ම වැලියම් නමැති වෙළෙඳ නාමයෙන් ඖෂධ සමාගම් රුපියලකට වික්කේ ය. රුපියලේ පෙත්ත අගයෙන් වැඩි බව කීමට ප්‍රචාරක කටයුතු සඳහා විශාල මුදලක් වියදම් කළ සමාගම්, වෛද්‍යවරුන් ලවා මිල වැඩි පෙත්ත රෝගීන්ට නියම කරවී ය.

අතිවිශාල ලාභ ලැබූ මේ සමාගම්වලට රාජ්‍ය නායකයන් හැසිරවීමට පවා හැකි විය. ඔවුන්ගේ ඖෂධ වෙළෙඳාමට බලපෑම් කරන නො දියුණු රටවල පාලකයන්ට සිය රටෙහි පාලකයන් ලවා බලපෑම් කළ හැකි විය. සිය රටෙහි ජනතාවට අහිතකර යයි තහනම් කළ ඖෂධ වර්ග වෙනත් නම් යොදා නොදියුණු රටවල අලෙවි කිරීමට ඒ සමාගම්වලට හැකි වූයේ දේශපාලනික වශයෙන් බලපෑම් කිරීමට ඔවුන්ට වූ ශක්තිය නිසා ය. ඇතැම් රටවල පාලකයෝ සිය සහෝදර රටවැසියන්ට වඩා පිටරට සමාගමකින් ලැබෙන මිල මුදලට ප්‍රිය කළහ. රටට අනවශ්‍ය බෙත් වර්ග ද අලෙවි කිරීමට මේ සමාගම්වලට හැකි විය.

සේනක බිබිලේ මේ තත්ත්වයන් වටහා ගනිමින් ශ්‍රී ලංකාවට ගැළපෙන ඖෂධ ප්‍රතිපත්තියක් සැලසුම් කළේ ය.

**එහි ප්‍රධාන යෝජනා පහක් විය:**

1. ලංකාවට අනවශ්‍ය බෙහෙත් වර්ග ගෙන්වීම නතර කිරීම.
2. රාජ්‍ය ආයතනවලත් පෞද්ගලික අංශයේත් ඖෂධවලට ඖෂධීය හෙවත් නිල නාමය පමණක් යෙදීම.
3. මෙරට ඖෂධ ගෙන්වීම සහ මෙරට ඖෂධ බෙදා හැරීම සම්පූර්ණයෙන් ම රජයේ ආයතනයන්ට පැවරීම.
4. ලංකාවේ ඖෂධ නිෂ්පාදනය, තත්ත්ව පාලන අංශය සහ පර්යේෂණ අංශය දියුණු කිරීම.
5. ඖෂධ ගැන විද්‍යාත්මක කරුණු විශ්වාස කටයුතු ලෙස වෛද්‍යවරුන්ට සහ සෞඛ්‍ය සේවාවන්හි යෙදී සිටින අයටත් මහජනතාවටත් ලබා දී ඔවුන් සතු දැනුම පුළුල් කිරීම.

මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා 1971 සැප්තැම්බර් 22 වැනිදා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව පිහිටුවනු ලැබී ය. සේනක එහි සභාපතිවරයා විය. ඒ වන විටත්

ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මුල් ම වෛද්‍ය පීඨාධිපති වශයෙන් කටයුතු කරමින් සිටියේ ය.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති වශයෙන් විශාල වැටුපක් ලබා ගැනීමට සේනක බිබිලේට හැකියාව තිබුණ ද ඔහු එය ප්‍රතික්ෂේප කළේ ය.

"වෛද්‍ය විද්‍යාලයෙන් මට වැටුපක් ලැබෙනවා. එය මට ප්‍රමාණවත්. ජාතික ඖෂධ ප්‍රතිපත්තිය මා සිතන හා පතන ආකාරයට ක්‍රියාත්මක කිරීමට ලැබුණොත් එය සතුටක්. ඒ සතුට මට ඇති. වැටුප එපා" ඔහු කී ය.

1972 ජුලි මාසය තුළ නව ඖෂධ ප්‍රතිපත්තිය නිසා රුපියල් ලක්ෂ 60ක විදේශ විනිමයක් ඉතිරි කිරීමට ලංකාවට හැකි වූ බව ඇන්ක්ටැඩ් සංවිධානය වාර්තා කළේ ය.

සංස්ථාව ඇරඹෙන විට ලංකාවට ඖෂධ වර්ග 4000ක් සමාගම්වලින් ගෙන්වනු ලැබිණි. ලෝක සෞඛ්‍ය සංවිධානය රටකට අත්‍යවශ්‍ය ඖෂධ ප්‍රමාණය 240ක් බව නිර්දේශ කොට තිබිණ. සමාගම්වලින් වැඩිපුර ගෙන්වූයේ අනවශ්‍ය ඖෂධ යි. ලංකාවට ගෙන්විය යුතු අත්‍යවශ්‍ය ඖෂධ ප්‍රමාණය 171ක් බව සේනක කී ය. ඒ අනුව ඒ ප්‍රමාණය පමණක් ගෙන්වීමට ඔහු පියවර ගත්තේ ය.

ලංකාවෙහි ම ඖෂධ නිපදවීම ඔහුගේ ඊ ළඟ අරමුණ විය. වර්ෂයකට රුපියල් ලක්ෂ 19ක් අමුද්‍රව්‍ය පිටරටින් ගෙන්වන බෙත් පෙති සහ කරල් නිපදවන කම්හල් 15ක් සමාගම් සතු ව තිබිණ. රජයේ බෙත් ගබඩාව සහ පෞද්ගලික අංශය රුපියල් ලක්ෂ 71ක බෙත් පිටරටින් ගෙන්වී ය. අමුද්‍රව්‍ය සහ බෙත් ගෙන්වීමට රුපියල් ලක්ෂ 90ක් පිටරටට යැවීම අපරාධයක් සේ සැලකූ සේනක බෙත් සෑදීමට අමුද්‍රව්‍ය ගෙන්වීම මුළුමනින් ම සංස්ථාවට පැවරීමට කටයුතු කෙළේ ය.

1976 දී නොබැඳි ජාතීන්ගේ සමුළුව කොළඹ පැවැත්විණි. නොබැඳි රටවල නායකයන්ගේ නියෝජිතයෝ ලංකාවේ ක්‍රියාත්මක වන ඖෂධ ප්‍රතිපත්තිය පිළිබඳ සොයා බැලූහ.

සේනක ඔවුන්ට කරුණු පැහැදිලි කෙළේ ය. තුන් වසරක් තුළ රුපියල් කෝටි 11ක විදේශ විනිමය රැක දෙමින් අඩු මිලට වැඩි අගයක් ඇති ඖෂධ ලබා දීමෙන්, පෞද්ගලික ඖෂධ සමාගම්වල විවිධ බලපෑම්වලට මුහුණ දෙමින් මේ සංස්ථාව ඉටු කළ ජනතා මෙහෙවර දුටු නොබැඳි රටවල නායකයෝ "අපේ රටවලත් මේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුයි. අපට මඟ පෙන්වන්න,"යි සේනකගෙන් ඉල්ලූහ.

ඊට අනුව වෛද්‍ය විද්‍යාලයෙන් සහ ඖෂධ සංස්ථාවෙන් ඉවත් වී ඇන්ක්ටැඩ් සංවිධානයේ ජ්‍යෙෂ්ඨ ඖෂධ ප්‍රතිපත්ති විශේෂඥයා ලෙස ඔහු ජිනීවා නගරයේ දී වැඩ බාර ගත්තේ ය.

ට්‍රිනිඩෑඩ්, ජැමෙයිකා, බාබේඩෝස්, ඩොමිනිකා, ග්‍රෙනාඩ්, ඇන්ටිගා, පුවටෝරිකෝ, ගයනා යන කැරිබියන් දූපත්වල ජනතාව සඳහා ඖෂධ ප්‍රතිපත්තියක් සකස් කිරීම සේනකට පැවරිණි.

ඒ දූපත්වල ඇවිද වාර්තාවක් පිළියෙල කිරීම පළමු කටයුත්ත විය. අනතුරු ව සැකසූ වාර්තාව ඇන්ක්ටැඩ් සංවිධානයේ සාකච්ඡාවට ලක් විය. එය වහා ක්‍රියාත්මක කළ යුතු වැඩපිළිවෙළක් බව සංවිධානය විසින් පිළිගන්නා ලදි.

එහි දී ලද අත්දැකීම් පිළිබඳව ඔහු මෙසේ පැවසී යඃ

"අප සංචාරය කළ සෑම තැනක දි ම අපට දකින්නට ලැබුණේ අපේ රටේ බිබිලේ දී මා දුටු පීඩාවට ලක් වූ මිනිසුන් ම යි. ඒ අසරණ ජනතාවට ඖෂධ මගින් හෝ සේවය කිරීමට අපට ලැබුණු මේ අවස්ථාව අත හරින්න බැහැ. ඇත්තට ම ඖෂධ ප්‍රතිපත්තියකින් පමණක් මේ ජනතාවගේ ජීවිත සැපවත් කරන්න බැහැ. ඔවුන් මුදා ගැනීමට ලොව පුරා පැතුරුණු මහා ජනතා විප්ලවයක් අවශ්‍ය යි..."

සේනකට තම අදහස ක්‍රියාත්මක කළ නොහැකි විය. හදිසි හෘදයාබාධයකින් ඔහු මිය ගියේ ය.

එක් සේනක බිබිලේ කෙනකු මෙසේ මිය ගිය ද රටවල් කිහිපයක ම සේනක බිබිලේ වැන්නෝ බිහි වුණහ.

ඕස්ට්‍රේලියාවේ ජාතික ඖෂධ ප්‍රතිපත්ති මණ්ඩලයේ නියමු දොස්තර හාටි 1993 දී ලංකාවට පැමිණ මෙසේ කී යː

"ලංකාව කඳු මුදුනකි. සේනක බිබිලේ එහි බැබළෙන පහනකි. අපි ඒ පහනේ එළියෙන් අපේ රටවල ඖෂධ ප්‍රතිපත්ති හදා ගන්නෙමු."

## අවබෝධය

1. මහාචාර්ය සේනක බිබිලේ විසින් දරන ලද තනතුරු මොනවා ද?
2. ඔහුගේ මුළු ජීවිතය ම අයිති යැයි පැවසෙන්නේ කාහට ද? එසේ කීමට හේතුව කුමක් ද?
3. ශ්‍රී ලංකාවට ගැළපෙන පරිදි සැලසුම් කළ ජාතික ඖෂධ ප්‍රතිපත්තියට ඇතුළත් වූ යෝජනා මොනවා ද?
4. විදේශිකයන් පවා මොහු ආදර්ශයට ගන්නා බව දැක්වෙන පාඨය උපුටා දක්වන්න.
5. මෙතුමාගේ චරිතයෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ මොනවා ද?

## ලිඛිත අභ්‍යාස

**පහත සඳහන් වචනවල අර්ථ පැහැදිලි කරන්න.**

1. ඖෂධ -
2. පර්යේෂණ -
3. නිර්යාත -
4. ප්‍රතිපත්තිය -
5. පෞද්ගලික -
6. විද්‍යාත්මක -

## ප්‍රායෝගික අභ්‍යාස

1. **අප ජීවිතයට ආදර්ශ ගත හැකි චරිතයක් අධ්‍යයනය කරන්න.**
2. **ඔහුගේ/ ඇයගේ ජීවිතයෙන් අපට ලබා ගත හැකි ආදර්ශ පිළිබඳව පන්තිය ඉදිරියේ කතාවක් පැවැත්වීමට සූදානම් වන්න.**

## වාර්තාකරණය

වාර්තා යනු කිසියම් සිදුවීමක් පිළිබඳ තොරතුරු ලේඛනගත කිරීමේ ක්‍රමයකි.

පුවත් පත් වාර්තා, රැස්වීම් වාර්තා ආදි විවිධ වාර්තා වර්ග ඇත. පුවත් පත් වාර්තා යනු එදිනෙදා අසන්නට දකින්නට ලැබෙන සිදුවීම් ඇසුරෙන් පුවත් පත් සඳහා සම්පාදනය කෙරෙන වාර්තා ය. පුවත් පත් වාර්තාවක දී අදාළ සිදුවීමට සම්බන්ධ පුද්ගලයන්, එය සිදු වූ ස්ථානය, දිනය, වේලාව, සිදු වූ ආකාරය, පසුබිම් තොරතුරු ආදිය නිරවුල් ව පැහැදිලි ව ඇතුළත් කළ යුතු ය. අත්‍යවශ්‍ය තොරතුරු පමණක් සටහන් කර අනවශ්‍ය දීර්ඝ විස්තර බැහැර කිරීම වැදගත් වේ.

රැස්වීම් වාර්තාවක දී ද රැස්වීම පැවැත්වූ කාරණය, දිනය, වේලාව, ස්ථානය, සහභාගී වූ අය සටහන් කිරීම අතිශය වැදගත් වන අතර රැස්වීමේ දී සාකච්ඡා කළ කරුණු සංක්ෂිප්ත ව නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කළ යුතුය.

මෙහි දී අවධානය යොමු කෙරෙන්නේ පුවත් පත් වාර්තා කෙරෙහි ය.

### ලංකාවේ ශිෂ්‍යයකුගේ නමින් තරුවක්...

■ අකලංක මිද්දෙණිය

**ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ පාසල් ශිෂ්‍යයකු වන විසි හැවිරිදි කේ. ජී. දිනේෂ් අනුරුද්ධ චිත්‍රානන්ද කපුගේ විසින් නිර්මාණය කරන ලද යාන්ත්‍රික ට්‍රැක්ටරය ඇමරිකා එක්සත් ජනපදයේ ඇරිසෝනා ප්‍රාන්තයේ ෆීනික්ස්හි දී පැවති ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා ඉංජිනේරු ප්‍රදර්ශනයේ ඉලෙක්ට්‍රික් ඉංජිනේරු අංශයේ ප්‍රථම ස්ථානය දිනා ගැනීමට සමත් වී ඇත. ඔහු එම සම්මානය දිනා ගැනීමෙන් අනතුරුව ඔහුගේ නමින් තරුවක් නම් කිරීමට නාසා ආයතනය කටයුතු කර ඇති බව පැවසේ. එම තරගය සඳහා රටවල් 76ක් නියෝජනය කරමින් 1500කට වැඩි පිරිසක් සහභාගි වී ඇත.**

### ප්‍රායෝගික අභ්‍යාස

1. ඔබ පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය පිළිබඳ ව පුවත් පතකට යොමු කිරීම සඳහා වාර්තාවක් සකස් කරන්න.
2. විවිධ තේමා ඔස්සේ සම්පාදනය වී ඇති පුවත් පත් වාර්තා එක් රැස් කර ලිපි ගොනුවක් සකස් කර පන්තියේ යහළුවන් සමග හුවමාරු කර ගෙන ඒවා පරිශීලනය කරන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## න්‍යාය පත්‍ර

උත්සවයක්, රැස්වීමක්, වැඩමුළුවක් වැනි කිසියම් විශේෂිත අවස්ථාවක එම අවස්ථාවට අදාළ කාර්යයන් නිශ්චිත කාල රාමුවකට හා අනුපිළිවෙළකට පෙළ ගස්වා සකස් කරන ලද සැලැස්මක් න්‍යාය පත්‍රයක් ලෙස හැඳින්වේ.

පහත දැක්වෙන්නේ රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සවයේ න්‍යාය පත්‍රයකි. එහි එක් එක් කාර්යයන් ඊට නියමිත වේලාව සහ ක්‍රියාත්මක කරන්නෝ කවුරු ද ආදි තොරතුරු ඇතුළත් කර ඇති ආකාරය විමසා බලන්න.

**රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සව කාර්යාවලිය**

| | | |
|---|---|---|
| ප.ව.2.15 | - | ආරාධිත අමුත්තන් අසුන් ගැනීම |
| ප.ව.2.30 | - | මංගල භේරි සංධ්වනිය හා පහන් දැල්වීම |
| ප.ව.2.40 | - | සමාරම්භක නර්තනය |
| | | නර්තන වින්‍යාසය - **රවිබන්ධු විද්‍යාපති** |
| ප.ව.2.45 | - | සාහිත්‍යවේදීන්ට සුබපැතුම් |
| | | **විජිත් කණුගල** - සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ |
| ප.ව.2.55 | - | සාහිත්‍යවේදීන්ට සුබපැතුම් |
| | | **වසන්ත ඒකනායක** |
| | | ලේකම් - සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය |
| ප.ව.3.05 | - | නර්තනාංගය |
| | | නර්තන වින්‍යාසය - **වාසුකී ජෙගදීශ්වරන්** |
| ප.ව.3.10 | - | සම්මාන ප්‍රදාන ලේඛනය භාරදීම හා සුබපැතුම් |
| | | **මහාචාර්ය සමන්ත හේරත්** |
| | | සභාපති - රාජ්‍ය සාහිත්‍ය අනුමණ්ඩලය |
| ප.ව.3.20 | - | නර්තනාංගය |
| | | නර්තන වින්‍යාසය - **කුලසිරි බුදවත්ත** |
| ප.ව.3.25 | - | සම්මාන ප්‍රදාන පළමු අදියර |
| ප.ව.4.00 | - | නර්තනාංගය |
| | | නර්තන වින්‍යාසය - **රවිබන්ධු විද්‍යාපති** |
| ප.ව.4.05 | - | සම්මාන ප්‍රදාන දෙවන අදියර |
| ප.ව.4.40 | - | නර්තනාංගය |
| | | නර්තන වින්‍යාසය - **චන්න විජේවර්ධන** |
| ප.ව.4.45 | - | සාහිත්‍යවේදීන්ට සුබපැතුම් |
| | | **ගරු ටී.බී.ඒකනායක** |
| | | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා |
| ප.ව.4.55 | - | සම්මාන ප්‍රදාන තෙවන අදියර |
| ප.ව.5.30 | - | නර්තනාංගය |
| | | නර්තන වින්‍යාසය - **කුලසිරි බුදවත්ත** |
| ප.ව.5.35 | - | ශුභාශිංසන |
| | | **අතිගරු මහින්ද රාජපක්ෂ** |
| | | ජනාධිපතිතුමා |
| ප.ව.5.45 | - | සම්මාන හා සාහිත්‍යරත්න අභිධාන ප්‍රදානය |
| ප.ව.6.20 | - | සම්මාන ප්‍රදානෝත්සවයේ සමාප්තිය |
| | | ජාතික ගීය |

## ප්‍රායෝගික අභ්‍යාස

1. **පන්තියේ සාහිත්‍ය සමිතිය හෝ වෙනත් සමිතියක හෝ රැස්වීමක් සඳහා න්‍යාය පත්‍රයක් සකස් කරන්න.**
2. **පාසලේ වාර්ෂික ක්‍රීඩා උත්සවය සඳහා න්‍යාය පත්‍රයක් පිළියෙල කරන්න.**